# විෂය - බුද්ධ ධර්මය

# 6 ශ්‍රේණිය

# නිපුණතාව 7.0

**ජීවී අජීවී පරිසරයට හිතකාමී ව හැසිරෙයි**

# නිපුණතා මට්ටම - 6.7.2

**භෞතික පරිසරයේ වටිනාකම තේරුම්**
**ගෙන පරිසර සංරක්ෂණයට දායක වෙයි .**

# පාඩම

**16 රකින විට පරිසරය - රැකෙනු ඇත අප සැම**

අධ්‍යාපන අමාත්‍යාංශය — ආගමික හා සාරධර්ම ශාඛාව


සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)
කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය

**විෂය - බුද්ධ ධර්මය** **6 ශ්‍රේණිය**

**නිපුණතාව - 7.0**

**නිපුණතා මට්ටම - 6.7.2**

**පාඩම - 16 රකින විට පරිසරය රැකෙනු ඇත අප සැම**

- **01 සිට 05 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.**

**01**. ලෝක පරිසර දිනය යෙදී ඇත්තේ සෑම වසරකම,

1. ජුනි 05 වන දාටයි.
2. ජුලි 05 වන දාටයි.
3. නොවැම්බර් 05 වන දාටයි.
4. දෙසැම්බර් 05 වන දාටයි.

**02**. පරිසරය යනු,

1. මිනිසා හැර සියලු ජීවින් ජීවත් වන වටපිටාවයි.
2. මිනිසා ඇතුළු සියලු ජීවින් ජීවත් වන වටපිටාවයි.
3. ජීවීන් හැර අජීවි දේ සහිත වටපිටාවයි.
4. මුහුද හැර ගොඩබිමට අයත් වටපිටාවයි.

**03**. ලෝකයේ පවතින මුළු ජල ප්‍රමාණයෙන් බීමට භාවිත කළ හැකි ප්‍රතිශතය,

1. 0.94% කි.
2. 0.64% කි.
3. 0.34 % කි.
4. 0.24 % කි.

**04**. දිවා රෑ පින් ලැබෙන පින්කමක් වන්නේ,

1. යාචකයන්ට දන් දීමයි.
2. වන උයන් තැනීමයි.
3. පහන් පූජා කිරීමයි.
4. මල් පූජා කිරීමයි.

**05**. සියලු සතුන්ට මෙත් වඩන ලෙස උපදෙස් ඇත්තේ,

1. රතන සූත්‍රයේ ය.
2. මහා මංගල සූත්‍රයේ ය.
3. කරණීය මෙත්ත සූත්‍රයේ ය.
4. අටවිසි පිරිත් සූත්‍රයේ ය.

අධ්‍යාපන අමාත්‍යාංශය ආගමික හා සාරධර්ම ශාඛාව

සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)
කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය

**06.** පහත වාක්‍ය නිවැරදි නම් '√' ලකුණ ද, වැරදි නම් '×' ලකුණ ද යොදන්න.

I. පරිසර දූෂණයෙන් තුරුලිය විනාශ වී වැස්ස අඩු වේ. (……..)

II. අපට පිරිසිදු වාතය ලැබෙන්නේ පරිසරයෙනි. (……..)

III. ප්ලාස්ටික් හා පොලිතින් පරිසරයට හානි නො කරයි. (……..)

IV. බුදු දහම අනුව රජතුමා සතුන් ද රැකිය යුතු ය. (……..)

V. වැසි කාලයේ භික්ෂූන් වහන්සේලා වස් විසිය යුතු ය. (……..)

**07.** පහත වාක්‍යවල හිස්තැනට සුදුසු පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.

I. බුදු රජාණන් වහන්සේ සුන්දර .............................. ඇලුම් කළ සේක.

II. ඇළ දොළට අපද්‍රව්‍ය දැමීමෙන් ............................. දූෂණය වේ.

III. වාහනවල විෂ .......................... පෙනහැලි රෝග ඇති කරයි.

IV. බුදු දහමේ වැස්ස ...................... ලෙස හඳුන්වා දී ඇත.

V. ගස් කැපීම, අතු කැඩීම ........................... භික්ෂූන්ට වරදකි.

(මිතුරකු, දුම්, පරිසරය ,උපසම්පදා, ජලය)

**08.** පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා ඔබට ඉටු කළ හැකි කරුණු පහක් ලියන්න.

I. ...................................................................................................................

II. ...................................................................................................................

III. ...................................................................................................................

IV. ...................................................................................................................

V. ...................................................................................................................

(ල.20)

අධ්‍යාපන අමාත්‍යාංශය — ආගමික හා සාරධර්ම ශාඛාව

සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)
කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය

## 6 ශ්‍රේණිය - පාඩම 16 - පිළිතුරු

**01.** – 1 **02.** – 2 **03.** – 3 **04.** – 2 **05.** – 3

**06.** (i) √ (ii) √ (iii) × (vi) √ (v) √

**07.** (i) පරිසරයට
(ii) ජලය
(iii) දුම්
(vi) මිතුරකු
(v) උපසම්පදා

**08.** (i) ගස් වැල් සිටුවා රැක ගැනීම
(ii) දිරන කොළ රොඩු ආදියෙන් පොහොර සෑදීම
(iii) නොදිරන අපද්‍රව්‍ය නිසි ලෙස බැහැරලීම
(vi) දිනපතා අවට පරිසරය පවිත්‍ර කිරීම
(v) පරිසරය රැකීමේ අගය අන් අයට කියා දීම (ආදී සුදුසු කරුණු පහක්)

(ල.20)

අධ්‍යාපන අමාත්‍යාංශය ආගමික හා සාරධර්ම ශාඛාව
සැකසුම - අයි ජී වසන්ත කුමාර - ගුරු උපදේශක (බුද්ධ ධර්මය)
කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලය